# කිසිදු දේශපාලන පදනමක් නැති අයත් ඡන්දයට නාමයෝජනා දීලා

## පැෆරල් කියයි

■ **බද්දේගම - ඕ. කමලනාථ්**

දේශපාලන පක්ෂ 59ක් සහ ස්වාධීන කණ්ඩායම් ඇතුළුව අපේක්ෂකයන් 8,888ක් පමණ සංඛ්‍යාවක් මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට නාමයෝජනා ලබාදී තිබුණද ඉන් සියයට 20%කට අඩු ප්‍රමාණයක් පමණක් මේ වන විට, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදුකරමින් ක්‍රියාකාරීව සිටින බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කරයි. "දේශපාලන පක්ෂ දෙකක් තුනක් හැරෙන්න සෙසු දේශපාලන පක්ෂ මැතිවරණ ප්‍රචාරක කටයුතු ක්‍රියාකාරීව කරන ආකාරයක් දක්නට ලැබෙන්නේ නැහැ.

මෙවර මැතිවරණ තුළ තරගකාරී ආකාරයේ ප්‍රචාරණයක් ප්‍රදර්ශනය වෙන්නෙත් නැහැ. සමාජ මාධ්‍ය ප්‍රචාරණය තිබුණත් පෙර පැවැති මැතිවරණවලට සාපේක්ෂව අවම මට්ටමක තියෙනවා. කිසිදු දේශපාලන පරිචයක්, දේශපාලන පදනමක් නැති අයත් මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට නාමයෝජනා දී තිබෙනවා. සමාජයේ සිටින ඕනෑම පුද්ගලයෙක්ට පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වීමේ හැකියාව තිබෙන බවට සමාජය තුළ විශ්වාසයක් ගොඩනැඟී තිබෙනවා. මැතිවරණයට ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන්ගෙන් සියයට 20%කට අඩු ප්‍රමාණයක් පමණක් සක්‍රියව මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල නිරතව සිටිනවා. සෙසු අය නිහඬව සිටිනවා.

අපේක්ෂකයා පිළිබඳව පෞද්ගලිකව දැනුවත්ව සිය ඡන්දය ලබාදෙන ලෙස ඉල්ලීමක් කරනවා" යැයිද හෙට්ටිආරච්චි මහතා කීවේය.